# පුවත්පත් නිවේදනයයි.

---

# අවසන් ගමන් යන බොරළුගොඩ වීරවරියට අපගේ ආචාරය

කැරොලයින් ඇන්තනී පිල්ලෙයි 1908 ඔක්තෝම්බර් 08 වන දින අවිස්සාවේල්ල බොරළුගොඩ ග්‍රාමයේ උපත ලැබීය. ඇය අභාවප්‍රාප්ත පිලිප් ගුණවර්ධවයන්ගේ සහ රොබට් ගුණවර්ධනයන්ගේ නැගණියයි.

සොහොයුරන්ගේ මග යමින් දේශපාලනයට පිවිසි ඇය එක්දහස් නවසිය තිස් ගණන්වල මුල් භාගයේදී ආරම්භ කළ ලංකා ජාතික ව්‍යාපාරයේ ක්‍රියාකාරී සාමාජිකාවක වූ අතර, 1935 දී ආරම්භ කළ ලංකා සම සමාජ පක්ෂයේ ආරම්භක සාමාජිකාවක් ද වූවාය.

අධිරාජ්‍ය විරෝධී අරගලයේ දී කැපී පෙනෙන ස්ත්‍රී ක්‍රියාකාරිනියක් වූ ඇය කම්කරු පංතිය නගා සිටුවීම සඳහා ද දැඩි වෙහෙසක් දැරුවාය. එමෙන්ම ඇගේ සුවපහසු ජීවිතය විප්ලවීය සමාජ ක්‍රියාකාරකම් වෙනුවෙන් කැපකළ ඇය අවදානම හා දුෂ්කරතා ඉදිරියේ කිසිවිටෙකත් නොපසුබට වූවාය. අන්‍යයන් උනන්දු කරවන බලවේගයක් මෙන්ම ඔවුන්ට මඟ පෙන්වන ගුරුහරුකම් දෙන්නියක් වූ ඇය විවියන් ගුණවර්ධන වැනි විප්ලවීය සමාජවාදී ස්ත්‍රී නායිකාවන් බිහිකිරීමට ද පුරෝගාමී විය.

සිය උපන් බිමට පමණක් ඇගේ ක්‍රියාකාරීත්වය සීමා නොකළ ඇය සිය සැමියා වන සී. ඒ. එස්. අන්තෝනි පිල්ලේ සහෝදරයා සමඟ එක්ව ඉන්දියානු කම්කරු සටන් ව්‍යාපාරයට ද කැපී පෙනෙන දායකත්වයක් ලබා දුන්නාය.

ඇයගේ 100 වන උපන් දිනය වෙනුවෙන් අප විසින් පුවත්පත්වලට යවන ලද පත්‍රිකාව ද වැඩි විස්තර ලබා ගැනීම සඳහා මේ සමඟ ලැබීමට සලස්වන අතර අවසන් ගමන් ගිය අභීත සටන්කාමී නායිකාව වෙනුවෙන් ඔබ පුවත්පත තුළ යම් ඉඩකඩක් වෙන්වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

ස්තුතියි.

**කාන්තාව හා මාධ්‍ය සාමූහිකය**

**2009 ජූලි 08 දින**